මාගේ අංකය-DCDSP/02/18/03
සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
පෙට්ටිගලවත්ත, ගාල්ල
2022/06/ 30

සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස්, (ප්‍රධාන නාර්යාලය/ගාල්ල/මාතර/හම්බන්තොට)

<u>සමූපකාර සමිති පනතින් හා රීති වලින් පැවෙරන බලතල අනුව සහකාර කොමසාරිස්වරු කටයුතු කිරීම.</u>

යථෝක්ත කරුණට අදාලව ම විසින් ඔබ වෙත නිකුත් කර ඇති මාගේ අංක දපස/සමූ.සං/සං/18 දරණ 2018.11.19 දිනැති ලිපිය මෙයින් අවලංගු කරමි.

02. සමූපකාර සමිති පනත හා රීති වලින් රෙජිස්ට්‍රාර් වෙත පැවරෙන බලතල වලින් විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් ගැසට් නිවේදනයක මාර්ගයෙන් සහකාර කොමසාරිස්වරුන් වෙත පවරා ඇති බලතල ක්‍රියාත්මක කිරීමට සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස්වරුන්ට හැකි නමුත් එසේ ක්‍රියා කිරීමේදි පහත සඳහන් සීමා කිරීම්වලට යටත්ව කටයුතු කල යුතු බව දන්වමි.

| බලතල | කාරණය | සීමාව |
|---|---|---|
| 8.වගන්තිය<br>33 රීතිය | අතුරු ව්‍යවස්ථා සංශෝධනය | අතුරු ව්‍යවස්ථාවක මුල් ස්වරූපය වෙනස් වන ස්වභාවයේ සංශෝධන සඳහා ස.සං.කො.රේ ගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. |
| 9.වගන්තිය | සමිති ඒකාබද්ධය | සහකාර කොමසාරිස්වරුන්ට බලතල නොමැත. |
| 33.වගන්තිය<br>48.රීතිය | වත්කම් පිළිබඳ කටයුතු | I. චංචල/ නිශ්චල දේපළ අත්පත් කර ගැනීමේදී රු.10,000,000.00 (ලක්ෂ 100) දක්වාද, බැහැර කිරීමේදී 5000,000.00 (ලක්ෂ50) දක්වාද සහකාර කොමසාරිස්වරුන්ට කටයුතු කිරීමට බලය ඇත.<br><br>II. ඉදි කිරීම් රු.10,000,000.00 (ලක්ෂ 100) දක්වා ද වාහන අළුත්වැඩියා සම්බන්ධයෙන් රු.5,000,000.00 (ලක්ෂ 50) දක්වා සහකාර කොමසාරිස්වරුන්ට බලය ඇත. |
| රීති. 51 | නුසුදුසු පුද්ගලයන් ඉවත් කිරීම | සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස්වරුන්ට බලතල නොමැත. |
| රීති.52<br>50 (අ) , ආ | ලියාපදිංචිය අවලංගු කිරීම | ස.සං.කො.රේ. ගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. |
| 53. වගන්තිය<br>54.වගන්තිය | ඇවරකරුවන්ගේ බලතල | වත්කම් බෙදා හැරීම සඳහා ස.සං.කො.රේ. ගේ අනුමැතිය ලබා ගත යුතුය. රු.5000.00 ට අඩු කපා හැරීම් සඳහා සහකාර කොමසාරිස්ට බලය ඇත. |

| | | |
|---|---|---|
| 58.වගන්තිය | තීරකවරුන් පත් කිරීම | රු.2,000,000.00 (ලක්ෂ 20) දක්වා වන විවිධ ආරවුල් සඳහා තීරකවරු නම් කිරීමට සහකාර කොමසාරිස්වරුන්ට බලය ඇත. |

03. සහකාර කොමසාරිස්වරුන් විසින් සමූපකාර සමිති වල අතුරු ව්‍යවස්ථා අර්ථ නිරූපණය නොකළ යුතු අතර එවැනි අවශ්‍යතාවයක් මතු වූ විට මා වෙත යොමු කළ යුතුය.

04. සමිතිවල මූල්‍යමය සම්පත් ආරක්ෂා වන පරිදි හා සාමාජික හා සාමාජික නොවන තැන්පත් වල ආරක්ෂාව තහවුරු වන පරිදි අවශ්‍ය අනුමැතීන් ලබා දීමට සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස්වරු කටයුතු කළ යුතුය.

05. සමූපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය මඟින් සමූපකාර සංවර්ධන කොමසාරිස් වෙත පැවරී ඇති බලතල සහකාර කොමසාරිස්වරුන්ට අභිනියෝජනය කල නොහැකි බැවින් එම කටයුතු මා වෙත පමණක් පැවරෙන බව අවධාරණය කරමි.

06. අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීමේදී වුවත් පළාත් සභා ප්‍රතිපාදන හෝ මධ්‍යම රජයේ ප්‍රතිපාදන වැයවේ නම් මාගේ පූර්ව අනුමැතිය හා උපදෙස් ලබා ගත යුතු බවද වැඩි දුරටත් දන්වමි.

ටී.ජී.සරත් කුමාර,
සමූපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්,
සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
දකුණු පළාත

ටී. ජී. සරත් කුමාර
සමූපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්
සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
දකුණු පළාත

පිටපත්

1. සියළුම දිස්ත්‍රික් නිලධාරීන් - කාර්. දැ.පි.
2. සියළුම මූලස්ථාන සංවර්ධන නිලධාරීන් -කාර්. දැ.පි.
3. සියළුම සමූපකාර සංවර්ධන නිලධාරීන් -කාර්. දැ.පි.